### (ආ) වෘත්තීය නිලධාරීන් [C9 සහ C8 ශ්‍රේණි සඳහා වෘත්තිමය කාර්යය මණ්ඩලය අවශ්‍ය නොවේ]

- C7 සඳහා වෘත්තිමය කාර්යය මණ්ඩලය සඳහා ඔබ හෝ ඔබ ආයතනයේ කොටස්කරුවන් අතර වෘත්තීයවේදීන් සිටී නම් ඔවුන්ගේ අධ්‍යාපන හා සේවා සහතික වල පිටපත් ඉදිරිපත් කර එය සනාථ කළ හැක. එසේ නොමැති නම් ඔබට උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීමට සිදුවන අතර තුන් අවුරුදු කාලසීමාවක් සඳහා එවැනි උපදේශකවරයකු සමග ඇති කරගනු ලබන ගිවිසුමක් සමග ඔහුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක් (අයදුම්පතට අමුණා ඇත) හා ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් ඉදිරිපත් කළ යුතු වේ. එවැනි උපදේශකවරයෙක් සඳහා දෙනු ලබන ලකුණු ප්‍රමාණය 2 කට සීමා වන අතර, ඔහු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගත කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වන නිර්ණායකයේ [CIDA/ID/10-M(S)] 1 වෙනි ඇමුණුමෙහි (පිටු අංක 27-31) සඳහන් කර ඇති පරිදි ඉංජිනේරු සහකාර හෝ ඊට ඉහළ ශ්‍රේණියකට අයත් විය යුතුය.
- මේ සඳහා ඔබට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ (NCASL) ශාඛා කාර්යාලවලට අනුයුක්ත කර ඇති ඉංජිනේරුවරයන්ගේ සේවයද ලබා ගත හැකිය.

### (ඇ) අධීක්ෂණ නිලධාරීන්

- ඔබ වසර 5 කට වඩා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබේ නම් හෝ CIDA ආයතනය විසින් කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරීම සඳහා පවත්වනු ලබන පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීමෙන් මේ සඳහා එක් ලකුණක් ලබා ගත හැක. අමතර ලකුණු ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ස්ථිර සේවයේ යෙදී සිටින අධීක්ෂණ නිලධාරීන් අවශ්‍ය වේ. එම අධීක්ෂණ නිලධාරීන් ලබා තිබිය යුතු සුදුසුකම් ඉහත සඳහන් අත් පොතෙහි [CIDA/ID/10-M(S)] 1වන ඇමුණුමෙහි "කාර්මික සහකාර හා එයට පහළ කාණ්ඩයන්" හි දක්වා තිබේ.

පළමුවරට වාර්තා පොත ලබා ගැනීම සඳහා ආයතනයේ අයිතිකරු පැමිණිය යුතු වේ. වාර්තා පොත CIDA ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයෙන් සතියේ වැඩ කරන දිනවල සවස 3.00ට පෙර ලබා ගත හැක.

### විමසීම්

| සම්බන්ධීකාරක | දිස්ත්‍රික්කය | දුරකථන අංකය |
|---|---|---|
| J M D D ජයමහ | අනුරාධපුර | 076 6 746 259 |
| අබ්දුල් ෂුකූර් ඉස්තිහාක් | අම්පාර | 077 2 988 112 |
| කන්දවෙල් අරුල්නිදි | මඩකලපුව | 077 3 863 362 / 011 3 680 011 |
| P හංසිකා ලියනගේ | කුරුණෑගල | 070 3 597 627 |
| K A නිර්මලා සුදර්ශනී | කෑගල්ල | 071 8 651 756 |
| S A M U සඳමාලි | මාතලේ | 070 5 959 243 |
| I M සෙනෙවිරත්න | ගාල්ල | 071 3 469 250 / 011 3 680 016 |
| P ප්‍රදීපන් | ත්‍රිකුණාමලය | 077 2 271 338 / 011 3 680 026 |
| K A ගයාන් කුමාර | මාතර | 070 7 258 291 / 011 3 680 005 |
| T සුතන් සුගෙන්ද්‍රා | යාපනය | 077 4 745 573 / 011 3 680 029 |
| තිරුඅරුල් දිනේෂ් | මුලතිව් | 077 2 847 368 / 011 3 680 028 |
| ජෆීර් සිෆා ෆර්වින් | පුත්තලම | 077 7 283 668 |
| P G N මධුවන්ති | මහනුවර | 070 4 997 488 |


**අප හා සම්බන්ධ වන්න**

**CIDA ප්‍රධාන කාර්යාලය**

123, සව්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07

දූරකථනය : 011 2 69 9801 , 011 2 695 965 , 011 2 686 092

**තොරතුරු අංශය**

දූරකථනය: 011 2 699 801 ෆැක්ස්: 011 2 686 089

විද්‍යුත් ලිපිනය: cidadevelopment@gmail.com අන්තර්ජාල අඩවිය: www.cida.gov.lk


CIDA | DEV | REG | W1 | 11 (S)

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුකරුවන් ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය යටතේ

# ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචිවීම පිළිබඳ උපදෙස්

මැයි 2026

## C7 C8 C9 ශ්‍රේණි සඳහා




නිවාස, ඉදිකිරීම්, සහ ජල සම්පාදන අමාත්‍යාංශය
வீடமைப்பு, நிர்மாணிப்பு, மற்றும் நீர் வழங்கல் அமைச்சு
MINISTRY OF HOUSING, CONSTRUCTION, AND WATER SUPPLY

CIDA
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

# ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය

1 ඔබේ ව්‍යාපාරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක හෝ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඒ සඳහා නිකුත් කරනු ලබන සහතිකයක් ලබා තිබිය යුතුය. ව්‍යාපාරයේ ස්වභාවය ලෙස "සියළු ඉදිකිරීම් කටයුතු" යනුවෙන් එහි සඳහන් කිරීම අවශ්‍ය වේ. "ප්‍රජාපාදක සංවිධාන" (Community Based Organizations), එම ආයතනය ස්ථාපිත කිරීම සඳහා අදාල වූ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා පනත යටතේ ලියාපදිංචිය සනාථ කිරීම සඳහා වලංගු ලේඛනයක් හෝ රාජ්‍ය ආයතනය මගින් නිකුත් කල වලංගු සහතිකයක් ඉදිරිපත් කල යුතුය.

2 "ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණි ගත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වන අයදුම්පත" ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තොරතුරු මධ්‍යස්ථානයෙන් රුපියල් 150.00 + VAT ක් ගෙවා ලබාගත හැක. තැපෑලෙන් ගෙන්වා ගන්නේනම් පහත දැක්වෙන පරිදි සම්පූර්ණ මුදල ගෙවීමෙන් ලබාගත හැක.

(අ) සභාපති - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නමින් වන බැංකු අණකරයකින නියමිත මුදල ගෙවීමෙන්

හෝ

(ආ) ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ අංක 77454975 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ගිණුමට මුදල් බැරකරන ලද ලදුපත, ලිපියක් සමග අධ්‍යක්ෂක (සංවර්ධන) - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන්

ලියාපදිංචි කිරීමේ පටිපාටිය - රු.950.00 + VAT
අයදුම්පත - රු.150.00 + VAT
ලියාපදිංචි තැපැල් ගාස්තුව
එක් ප්‍රකාශනයක් සඳහා රු. 85/-
ප්‍රකාශන දෙකම සඳහා රු. 95/-

(තම අවශ්‍යතාවට අදාළ පරිදි මුළු මුදලම ගෙවා තිබිය යුතුවේ)

3 ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, ඔබේ මූල්‍ය හැකියාවන් සනාථ කිරීමේ ලිපිවල හා ඔබේ හැකියාවන් සහ පළපුරුද්ද සනාථ කරන ලිපිවල සහතික කළ ඡායා පිටපත් ද සමග, CIDA ආයතනයේ තොරතුරු මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන්න. ඔබ ඉදිරිපත් කරන තොරතුරු හා ඡායා පිටපත් වල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා එම පිටපත් නීතිඥවරයෙකු හෝ නොතාරිස්වරයෙකු විසින් සහතික කළ යුතු අතර, අයදුම්පත්‍රයේ II වන ඇමුණුමෙහි ඇති දිවුරුම් ප්‍රකාශනය ද සම්පූර්ණ කළ යුතුය.

4 ඔබට ලබාගත හැකි කොන්ත්‍රාත්තුවල ඉහලම වටිනාකම තීරණය වන්නේ ලැබෙන ශ්‍රේණිය අනුවය. එක් එක් ශ්‍රේණියට අදාල ඉහල වටිනාකම පහත දක්වේ.

**C7 ශ්‍රේණිය** - රුපියල් මිලියන 10 සිට මිලියන 20 දක්වා
**C8 ශ්‍රේණිය** - රුපියල් මිලියන 4 සිට මිලියන 10 දක්වා
**C9 ශ්‍රේණිය** - රුපියල් මිලියන 4 දක්වා

5 මෙම ශ්‍රේණිගත කිරීම කරනු ලබන්නේ අංක 2430/13 ගැසට් පත්‍රය හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම, ශ්‍රේණිගතකිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වන කාර්යෝපදේශයේ අඩංගු උපදෙස් අනුවය. ඒ අනුව එක් එක් ශ්‍රේණිය සඳහා අදාල උපරිම ලකුණු ප්‍රමාණය මෙන්ම, විවිධ අවශ්‍යතාවයන් සඳහා නියම කර ඇති අවම ලකුණු ප්‍රමාණයන්ද ලබා ගත යුතුය. එම විස්තර පහත දක්වේ.

| ශ්‍රේණිය | ලබා ගත යුතු අනිවාර්ය අවම ලකුණු | | | | | | අතිරේක ලකුණු | ලබාගත යුතු මුළු ලකුණු ප්‍රමාණය | වසරකට ලියාපදිංචි ගාස්තුව රුපියල් | අයදුම්පත සැකසීමේ ගාස්තුව රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූල්‍ය පහසුකම් | | වෘත්තීය නිලධාරීන් | | අධීක්ෂණ නිලධාරීන්(අයිතිකරු) | | NCASLසාමාජිකත්වය (අනිවාර්ය නොවේ) | | | |
| | රුපියල් මිලියන | ලකුණු | පුද්ගලයින් සංඛ්‍යාව | ලකුණු | පුද්ගලයින් සංඛ්‍යාව | ලකුණු | ලකුණු | | | |
| C9 | 0.32 | 1.0 | - | - | 01 | 1.0 | - | 2.0 | 6,000+වැට් | 500+වැට් |
| C8 | 0.80 | 2.0 | - | - | 01 | 1.0 | 0.5 | 3.5 | 8,000+වැට් | 500+වැට් |
| C7 | 1.60 | 2.5 | 01 | 2.0 | 01 | 1.0 | 0.5 | 6.0 | 15,000+වැට් | 500+වැට් |

**(අ) මූල්‍ය පහසුකම්**

- වගුවේ ප්‍රමාණයට වඩා මූල්‍ය පහසුකම් පවතීනම් ඒ සඳහා වැඩිමනත් ලකුණු ලැබේ
- මූල්‍යමය අවශ්‍යතාවයන් පහත සඳහන් අයුරින් සපුරා ගත හැක.

- **ඉතිරි කිරීමේ ගිණුම** - මෙහි මාස තුනක (3) ඉතිරියෙහි මධ්‍ය අගය පදනම් කරගනු ලැබේ. එබැවින් පාස් පොතේ සත්‍ය පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කරන්න.
- **ජංගම ගිණුම** - මෙහි පසුගිය මාස 6 තුළ පැවති උපරිම සහ අවම ශේෂයන්හි මධ්‍ය අගය සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් පසුගිය මාස 6 සඳහා මාසික ගිණුම් වාර්තා සත්‍ය පිටපත් ඉදිරිපත් කරන්න.
- **ස්ථිර තැන්පතු** - අවම වශයෙන් මාස 6ක කාලයක් සඳහා ඉදිරියට යොදවන ලද තැන්පතු විය යුතුය.
- **ස්ථිර බැංකු අයිරා පහසුකම් -** ඔබ වෙත ප්‍රදානය කර ඇති ඒවා විය යුතුය.
- **දිසා ලේකම්ගෙන් ලබා ගත් වත්කම් සහතික** - සලකා බලනු ලබන්නේ ඔබ ඉල්ලා සිටින ශ්‍රේණියට අවශ්‍ය අවම මූල්‍ය අවශ්‍යතාවයෙන් අර්ධයක් (1/2) සපුරාලීමට පමණකි. අනිත් අර්ධය සඳහා වෙනත් මූල්‍ය පහසුකමක් තිබිය යුතුය.
  (⋆ වත්කම් සහතික වල වටිනාකමින් අර්ධයක් පමණක් අවශ්‍ය ලකුණු සඳහා පිළිගනු ලැබේ.)

| ශ්‍රේණිය | වත්කම් සහතික (රුපියල්) | අනෙකුත් මූල්‍ය පහසුකම් (රුපියල්) |
|---|---|---|
| C9 | 320,000.00 | 160,000.00 |
| C8 | 800,000.00 | 400,000.00 |
| C7 | 1,600,000.00 | 800,000.00 |